# ලෝකයේ ප්‍රථම අගමැතිනිය - භික්ෂුණියකගේ ඇසින්

ස්ත්‍රී භාවය පිළිබඳ සමාජ ඇගයුම සාපේක්ෂව පහත් අඩියක පැවති සමයක ආසියානු කාන්තාවක් තම රටේ රාජ්‍ය නායිකාව බවට පත්වීම සමස්ත ලෝක ප්‍රජාවට නවමු අත්දැකීමක් මෙන්ම පුවත් මැවීමේ ප්‍රස්තුතයක් වූවා නිසැකය.

ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙස විරුදාවලිය ලත්ශ්‍රී ලංකාව 20 වන සියවසේ මැද භාගයේදී ප්‍රථම අගමැතිනිය ලොවට හඳුන්වා දීමෙන් සමස්ත ලෝක ප්‍රජාවගේ අවධානය දිනාගත් කීර්තිමත් රාජ්‍යයක් බවට පත් වූවාය. තම මව් බිමට එවන් ගෞරවයක් අත්පත් කරදීමට සමත්වූ එම යුග නායිකාව අනෙකෙකු නොව 1960 දී මහජන ඡන්දයෙන් ශ්‍රී ලංකා රජයේ අගමැති පදවියට පත්වූ සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක මැතිනියයි. මෙම ජන නායිකාව ගැන සටහනක් තැබීම පිණිස, එදා අතීත මහා සමුළුවකදී ලෝක නායකයින් හමුවේ එතුමිය විසින් පළකරන ලද උදාර වැකියකින් මෙම සමරු ලිපිය අරඹනුයේ එය බණ්ඩාරනායක මැතිනිය පිළිබඳ වර්තමාන පරපුර දැනුවත් කිරීමෙහිලා අනගි පෙරවදනක් සපයන බැවිනි.

" මගේ රටේ නියෝජිතවරියක හැටියට පමණක් නොව මානව සංහතියේ සුරැකුම ගැන මහත්සේ උනන්දු වන ලෝකයේ කෝටි සංඛ්‍යාත කාන්තාවන් සහ මාතාවන්ගේ සිතුම් පැතුම් සහ හැඟීම් හඳුනන කාන්තාවක් සහ මවක් හැටියට මෙම මහා සමුළුවට සහභාගී වීමට ලැබීම ගැන මම සතුටුවෙමි "

(ශ්‍රී ලංකාවේ අගමැතිනිය සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක
1961 නොබැඳි ජාතීනගේ සමුළුව - බෙල්ග්‍රේඩ්)

"ලොවක් බිහි කරන්නේ අම්මා කෙනෙකි. ලොවක් පවතින්නේ හිරුගේ කිරණින් සහ අම්මාගේ දෙතනින් වැස්සෙන කිරි බිංදුවලිනුත්ය" යනුවෙන් මැක්සිම් ගෝර්කි නවකථාකරුවා පවසා ඇත්තේ ඔහු ඒ තරමටම මව් ගුණයේ වටිනාකම හඳුනාගත් බැවිනි. මේ අම්මාද එවැනි සුවිශේෂී මවකි. ඕ තොමෝ තම කුසින් බිහිකල දරු තිදෙනාට මවක වූවා පමණක් නොව මුළු මහත් ශ්‍රී ලාංකික දූ දරුවන්ගේද ලෝකයාගේද හද බැඳගත්තා වූ එඩිතර ප්‍රතාපවත් කාන්තා නායිකාවක්ද වූවාය.

"ඉත්ථි" ලෙස පාලි භාෂාවෙන් සහ "ස්ත්‍රී" ලෙස සංස්කෘත භාෂාවෙන් හඳුවන්වන කාන්තාව පිළිබඳ බෞද්ධ සංකල්පය මෙහිදී විමසා බැලීම සුදුසු යැයි හැඟේ. පුරුෂාධිපත්‍යය මුල්බැසගත් බමුණු සමාජය තුළ ස්ත්‍රියට තැනක් නොතිබිණි. බුදුන් වහන්සේ එම බමුණු මතයට පහරදී ස්ත්‍රියගේ නිදහස තහවුරු කළ අතර පුරුෂයා මෙන්ම ස්ත්‍රියද සමාන තලයක ලා සලකමින් ස්ත්‍රියක් වීම සමාජය තුළ අවතක්සේරුවට ලක්නොවිය යුතු බව කොසොල් රජතුමාට පැහැදිලි කර දුන් බව කෝසල සංයුක්තයේ සූත්‍ර ගණනාවකින් පැහැදිලි කෙරේ. ස්ත්‍රිය පිළිබඳව තවදුරටත් පැහැදිලි කරන බුදුන්වහන්සේ සුචරිතවත් (සසීලවා), නැණවත් (m%[a[jd), බුද්ධිමත් (මේධාවිනී) වැනි ගතිගුණවලින් සම්ප්‍රයුක්ත වන කාන්තාව සියළු කාන්තාවන් අතර උතුම් වූ කාන්තා රත්නයක් වන බව දේශනා කර තිබේ. වරෙක කොසොල් රජුගේ බිසව වූ මල්ලිකා දේවිය දියණියක බිහිකළ පුවත ඇසීමෙන් නොසතුටට පත්වූ කොසොල් රජතුමාට ස්ත්‍රියගේ අගය වර්ණනා කරමින් බුදු කෙනෙකු හා සක්විති රජෙකු වැනි උතුම් ශ්‍රේෂ්ඨ පුරුෂයින් පවා බිහිකරනු ලබන්නේද ස්ත්‍රියක විසින් බව පැහැදිලි කරදෙමින් රජුගේ සැක සංකා දුරුකරන ලද බව එම සූත්‍ර දේශනාවල දැක්වේ. බුදුන් වහන්සේ තම සුළු මවවූ ප්‍රජාපති ගෝතමී තෙරණින් වහන්සේ "බුද්ධ මාතාව" ලෙස හඳුන්වා දෙමින් එතුමියට නිසි ගෞරව සත්කාර දක්වා වදාල බව බුදු සිරිතෙහි සටහන් වීම අම්මා කෙනෙකුගේ අගය පිළිබඳව වර්තමාන ලෝකයා ආදර්ශයට ගත යුතු කරුණක් බව පැවසිය යුතුයි.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රාජ්‍ය පාලන භූමිකාව තුළ ඇය විශිෂ්ඨ වූත්, උතුම්වූත් මානව හැඟීම් පෙරදැරිව ක්‍රියාකරන ලද බවට උදාහරණ බොහෝය. කලෙක සිට දැවෙමින් තිබූ ඉන්දීය සම්භවයෙන් යුත් වතුකම්කරුවන් පිළිබඳ ප්‍රශ්ණය කිසිදු පාර්ශවයකට අගතියක් නොවන පරිදි විසඳාලීම එතුමියගේ මානව දයාව පෙරදැරි කරගත් රාජ්‍ය පාලනයේ කෘතහස්තභාවය මනාව පිළිඹිබු කරන්නකි.

මෙවැනි සංකීර්ණ ප්‍රශ්න විසඳීමේදී එතුමියගේ විචක්ෂණභාවය මැනවින් ප්‍රකට වූ අතර, විශ්ව විද්‍යාල සහතික හෝ එවැනි වූ වෙනත් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ අඩුවක් කිසිවිටෙකත් පිළිබිඹු නොවීය. වර්තමානයේ මෙවැනි ගැටළු විසඳීම සඳහා විවිධ මැදිහත්වීම් පිළිබඳව සාකච්ඡා කරනු ලබන අතර, ඒවා ගැටළු නිරාකරණය, පිරිස් කළමනාකරණය, යහ පාලනය වැනි විෂය මූලික අංශ ඔස්සේ සාකච්ඡාවට ලක්වන බව පෙනී යයි. **1972 දී සම්මත කරදෙනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයෙහි දී වාමාංශික නායකයින් වන එස්.එම්. කොල්වින්** වැනි විද්වතුන්ගේ සඳහා පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ අසුන්ගෙන සිටි ප්‍රබල නායකයින්ගේ සහාය ලබාගෙන ඉතා කෙටිකලක් තුළ ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය තහවුරු කෙරෙන ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාවක් රටට ප්‍රදානය කිරීමට එතුමිය එඩිතර වූවාය.තවද, දේශදේශාන්තරයන් සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පැවැත්වීමේදී ඇයගේ ප්‍රවේශයන් බොහෝදෙනාට එකඟ විය හැකි සිත්ගන්නා සුළු විසඳුම් සහිත ඒවා විය. මෙයට උදාහරණ වශයෙන් කච්චතිව් දූපත පිළිබඳ අයිතිය, මුහුදු සීමා නිර්ණය කිරීම වැනි විසඳුම් එතුමියගේ සහජ ඥානය, බුද්ධිය මෙන්ම මානව හිතවාදී ගුණයන් කැටිකොට ගත් ප්‍රවේශයන් වූ බව පැහැදිලිව කිව හැකිය.

පාසල් අධ්‍යාපනය ගැන සලකා බලන විට එවකට පැවති මිෂනාරි පාසල්, රජයේ පාසල්, රජයේ නොවන පාසල්, ද්‍රවිඩ භාෂා පාසැල් ආදී වශයෙන් මුහුණ පෑ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට එතුමිය දැඩි අවධානයක් යොමු කළාය. එතුමිය අනුගමනය කළ විසඳුම් දෙස ආපසු හැරී බැලීමේදී එම විසඳුම්වලට "මැද පිළිවෙත" පාදක කරගත් බවත් ඒවා සාකච්ඡා, සංවාද ඔස්සේ නිරාකරණය කිරීමට වගබලාගත් බවත් සඳහන් කිරීමට එමට සාක්ෂි තිබේ. එවකට පැවති අන්‍යාගමික පාසල්වල අධ්‍යාපනය ලැබූ බෞද්ධ දරුවනට බුදු දහම ඉගැන්වීම කළයුතු බවට වූ රජයේ නිර්දේශය ක්‍රියාත්මක නොවුන විට එතුමිය විසින් එය ක්‍රියාවට නැංවීම සඳහා විශේෂ අවධානයකින් ක්‍රියාකරනු ලැබිණි.

1971 ජනතා විමුක්ති පෙරමුණ විසින් රජයට එරෙහිව දියත් කරන ලද තරුණ කැරැල්ල හමුවේ එතුමිය අනුගමනය කළ පිළිවෙත මානවවාදී වූවා පමණක් නොව මාතෘත්වය පෙරදැරි කරගත් සහකම්පන ප්‍රවේශයක් ලෙස සඳහන් කළ හැකිය. තරුණ කැරැල්ලට නායකත්වය දුන් තරුණ තරුණයින් හට ජීවිත දානය දෙමින් සමාව ලබාදීමටත්, පුනුරුත්ථාපනය කර නැවත සමාජගත කිරීමටත් එතුමියගේ නියෝගය විය. බුදු දහමෙහි සඳහන් පරිදි ඕනෑම පුද්ගලයෙකුට නිවැරදි වීමේ ඉඩකඩ පවතින බැවින් ඒ සඳහා අවස්ථාව ලබාදීම එතුමිය ප්‍රායෝගිකව සනාථ කල බව අපට පෙනී යයි. එසේ වැරදිකරුවන් පුනුරුත්ථාපනය කිරීම සහ ඉන්පසු සමාජගත කිරීම හේතුවෙන් බොහෝ තරුණයින් සිය ජීවිත බේරාගැනීමට පමණක් නොව පසුකාලීනව මැති ඇමති වැනි තනතුරු ලබමින් යහපත් සමාජ මෙහෙවරයන්ට ද යොමුවූ බව ප්‍රකටය. ගුණගරුක විනීත කුල කාන්තාවක වශයෙන් සිරිමාවෝ අගමැතිනිය රටේ සියළු ජනකොටස්වල ගෞරවාදරයට පාත්‍ර වූවාය. මැතිනිය යන අන්වර්ථ නාමයෙන් අප රටේ ජනතාව විසින් පුදනු ලැබුවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ම පමණි.

කුඩා අවධියේ මා දුටු මැතිනිය චාම් ඔසරියකින් හැඩවී කොණ්ඩය පීරා බැඳ කොණ්ඩ කටුවකින් සරසාගෙන සාම්ප්‍රදායික හෙළ කතක් ලෙස අප රටකාන්තාවන්ට මහත් ආදර්ශයක් ගෙනදුන් බව මා සිහි කරන්නේ මහත් ගෞරවයෙනි. කාන්තා හැකියාවන් පුබුදු කිරීමෙහිලා ආරම්භ කරන ලද මහිලා සමිති ව්‍යාපාරයට එතුමිය නායකත්වය දුන්නාය. එමගින් දේශීය අත්යන්ත්‍ර කර්මාන්තය ශ්‍රී ලාංකික කාන්තාවන් අතර ජනප්‍රිය ස්වයං රැකියා මාර්ගයක් වූ අතර, එතුමියද අත් යන්ත්‍රයෙන් වියන ලද රෙද්දෙන් සැකසූ ඔසරියකින් සැරසී රට පුරා සැරිසැරියේ සියළු කාන්තාවන්ට ආදර්ශයක් දෙමිනි. එමගින් එතුමිය සියරට නිපැයුම්වලට අනන්‍යතාවයක් හා වටිනා මිලක් ලබාදුන්නාය.

සැදැහැවත් ගුණවත් කුල කාන්තාවක වශයෙන් මැතිනිය උදේ හවා බුදුන් වැඳ පුදා තුණුරුවනගේ ආශිර්වාදය ලබාගැනීමට අමතක නොකළාය. එතුමිය පිළිබඳ මගේ මතකය අවදි කෙරෙන එක් අවස්ථාවක් සඳහන් කිරීම මෙහිදී උචිත යැයි සිතේ. පසු කලක සංඝරාජ පදවියෙන් පුදලද අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රය හිමිපාණන් වහන්සේ මහරගම පිහිටි චන්ද්‍රශේඛරාරාමයට වැඩවාසය කළහ. ගරු අගමැතිනිය චන්ද්‍රශේඛරාරාමය පිහිටි අපේ ගමේ විහාරස්ථානයට පැමිණෙන බව අප හට දැනගන්නට ලැබුනි. එම විහාරස්ථානයට ප්‍රවේශවීම සඳහා කුඹුරු යායක් හරහා වැටුනු නියරක් දිගේ

ගමන් කොට විහාරස්ථානයට පිවිසිය යුතු විය. අගමැතිතුමිය මෙම විහාරස්ථානයට පැමිණීම සිදුවූයේ 1976 වසරේ යම් දිනකය. එතුමියගේ ආරක්ෂක නිලධාරීන්ට මෙන්ම අපගේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේටද මෙම මාර්ගය ඔස්සේ විහාරස්ථානයට ඇයගේ පැමිණීම පිළිබඳව ගැටළුවක් වූ බව අපට දැනිණි. සුදෝ සුදු සාරියකින් සැරසුනු අගමැතිතුමිය ගුරු පාරේ නැවැත්වූ මෝටර් රථයෙන් බැස වටපිට බලනු අපට පෙනිණි. මෙහොතක් ගතවිණි. “ මැඩම් මෙතන ඉඳලා යන්න අමාරුයි. නියර දිගේ යන එක හොඳ මදි යනුවෙන් “ ආරක්ෂක නිලධාරීන් කියන්නට ඇත. “නෑ මම නියර දිගේ ඇවිදගෙන යන්නම්; මට පුළුවනි නියර දිගේ ඇවිදගෙන යන්න. කෝ අයින් වෙන්න” යැයි එතුමිය කියන්නට ඇත.

එතුමිය සිනාමුසු මුහුණින් නියර දිගේ ඇවිදගෙන එනු අපි බලා සිටියෙමු. ඇයගේ සුදු සාරියේ තැනින් මඩ තැවරී තිබුණු අතර පාවහන් යුවලද මඩින් නැහැවී තිබුණි. තැවරුණු මඩ සෝදාගත් ඇය විහාර ගෙට ඇතුළුවෙද්දී “මැතිනිය පාර හදලා දෙයි” යනුවෙන් කවුදෝ කියනු ඇසිනි. “මැතිනියගේ හැටි එහෙම තමයි ඕනැම අමාරු තැනකට යනවා, අමාරුකම් බලන්නේ නෑ”.තවත් අයෙක් කියනු ඇසිණි.

මැතිනිය කොහේ ගියත් එතැනට අසල්වැසි ප්‍රදේශවලින් ඔවුන්ගේ කටයුතු පසෙකලා කාන්තාවන්ගේ පැමිණීම සුලබ දසුනක් විය. ගාම්භීර පෙනුමකින් යුත් චාම් ඔසරියකින් සැරසුනු එතුමිය දැකබලා ගැනීමට පැමිණි අය අතර බොහෝ අත්තම්මලා වූ බව අපට මතකය. එතුමිය ලංකා මාතාවගේ අභිමානනීය දියණියක වශයෙන් සිංහල බොදු **ඌරුව** ප්‍රකට කරමින් සිය කාර්යයන් ඉටුකරනු ලැබීම හෙල කාන්තාවන් වන අපට මහත් අභිමානයක් ගෙනදෙන කරුණකි.

අගමැති තනතුරෙහි සිටිමින් ගතකළ එතුමියගේ අවසන් උපන්දිනය සැමරුම් දිනයෙහි මාද එතුමියට බුලත් හුරුල්ලක් දී දිගාසිරි පැතූ හැටි මට සිහියට නැගේ. “ඔබ කොහෙද?” යැයි මගෙන් විමසූ විට “මහරගම” යැයි පැවසුවෙමි. අනතුරුව මා මගේ පියාගේ නම පැවසූ විට “හා හා මට මතකයි”යනුවෙන් එතුමිය පිළිතුරු දුන් විට මසිතට සියුම් සතුටක් දැනුණි. ඉන් අනතුරුව “මොනවද කෙරෙන්න ඕනෑ ?” යැයි ඇසූ විට, “මුකුත් ඕනෑ නෑ ඔබතුමියට සුබ පැතීමට පැමිණියෙමි” යි කියා මම ඇගෙන් සමුගතිමි.

මුළු රටම මහත්සෝ සයුරේ ගිල්ලවමින් එතුමියගේ අභාවප්‍රාප්ත වීම 2000 ඔක්තොම්බර් 10 දින සිදුවිය. මෙම අභීත කාන්තාවට අවසන් බුහුමන් දැක්වීමට හොරගොල්ල වලව්වට මා ගියේ ගිහි කාන්තාවක ලෙසිනි. ඇගේ නිසල දේහය දෙස නිමේශයක් නෙත් යොමා සිටි මා සිත තුළ නැගුනු පැනයක් විය. ඒ “මෙවැනි කාන්තාවන් ලොව තවත් සිටිත් ද” යන්නයි. දේහය අසල තිබූ සමරු සටහන් පොතෙහි ගැදියෙන් හා පැදියෙන් වැකි කිහිපයක් සනිටුහන් කල මා හට වසර 15 කට පසු එතුමියගේ ජන්ම ශත සංවත්සරය එළඹෙන මේ මොහොතේ මෙසේ සටහනක් තැබීමට ලැබීම අති දුලබ සුවිශේෂී අත්දැකීමක් ලෙස “පසිදුරන් තවා නිවනින් සැනසෙන්නට වෙහෙස දරන භික්ෂුණියක”ලෙස මම දකිමි.

බුද්ධ ශ්‍රාවිකාමහරගම උත්පලවණ්ණා